# ජනාධිපතිවරණය

පසුගිය දා පැවති ශ්‍රී ල නි පක්ෂයේ ජාතික සම්මේලනයේ දී පළමුව ජනාධිපතිවරණය පැවැත්විය යුතු බවට ඒකමතිකව තීරණය විය. ශ්‍රී ල නි පක්ෂයේ ව්‍යවස්ථාව අනුව පක්ෂ නායකත්වයට පක්ෂ සම්මේලනය ඉක්මවා යන බලතල ඇත්දැයි නො දනිමි. ඒ කෙසේ වෙතත් ජනාධිපතිවරණයක් පවත්වන්නේ ද නැත් ද, පවත්වන්නේ නම් ඒ කෙදිනක ද ආදිය පිළිබඳ ව ශ්‍රී ල නි ප නායකත්වය ගන්නා තීරණය රටට දැනුම් දෙනු ඇත්තේ මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති පදවියට පත් වී වසර හතරක් ඉක්ම යැමෙන් පසුව බව පැහැදිලි ය.

එයට හේතුවක් ඇත. අපේ ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවට අනුව ජනාධිපතිවරයකු පත් වී අවුරුදු හතරකට පසුව නැවත ජනාධිපතිවරණයක් පැවැත්විය හැකි ය. ජනාධිපතිවරණය පැවැත්වීම දැනුම් දිය යුත්තේ කෙදිනක ද යන්න ගැන පැහැදිලි ප්‍රකාශයක් ව්‍යවස්ථාවෙහි නැත. එවැනි අවස්ථාවක ඒ කුමක් දැයි තීරණය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයට භාරවෙයි. එවිට ඒ අර්ථනිරූපණයක් බවට පත්වෙයි. අර්ථනිරූපණය කෙසේ විය හැකි ද යන්න ගැන කල්තබා කිවහැකි නො වේ. ඉතා ප්‍රායෝගික දේශපාලනඥයකු වූ මහින්ද රාජපක්ෂ මහතා ඒ පිළිබඳ සිය අවධානය යොමු නොකෙළේ යැයි සිතීමට ඇති ඉඩකඩ ඉතා අඩු ය.

අප බොහෝ දෙනාට අමතක වී ඇතත් නිදහසින් පසුව ගතවූ අවුරුදු හැටඑකෙන් මේ වන විට වැඩි කාලයක් අප ගෙවා ඇත්තේ විධායක ජනාධිපති ක්‍රමය යටතෙහි ය. මේ වැඩි කාලය සුළු වූවක් වුව ද ඒ ඉතා වැදගත් කරුණකි. අප රටේ ඡන්ද දායකයන්ගෙන් යම් පිරිසක් තම මුළු ජීවිත කාලයම ගෙවා ඇත්තේ ද ඒ ක්‍රමය යටතෙහි ය. ඔවුන්ට වෙස්ට් මිනිස්ටර් ක්‍රමය ගැන ප්‍රායෝගික අත්දැකීම් නැත. විධායක ජනාධිපති ක්‍රමය වරදක් ලෙස දකින්නන් ක්‍රමයෙන් අඩුවන බවක් පෙනෙන්ට ඇත.

ජේ ආර් ජයවර්ධන මහතා විධායක ජනාධිපති ක්‍රමය හා මැතිවරණවල දී අනුපාත ක්‍රමය ඇති කෙළේ රට කෙරෙහි තිබූ ඇල්මක් නිසා නොව එ ජා පක්ෂයට රටේ තිබූ සියයට තිස්පහකට වැඩි ඡන්ද ප්‍රමාණය උපරිම ලෙස ඒ පක්ෂයෙහි වාසියට යොදා ගැනීම ට ය. එමෙන් ම තමාට රිසි පරිදි පාර්ලිමේන්තුවෙන් නිදහස් වීමේ අවශ්‍යතාව ද ඔහුට විය. කෙසේ වෙතත් නව ක්‍රමය යටතේ හිසිම පක්ෂයකට පාර්ලිමේන්තුවේ නැවතත් තුනෙන් දෙකක වැඩි ඡන්දයක් නොලැබේ යැයි ඒ මහතා විශ්වාස කළ බව පැහැදිලි ය.

විධායක ජනාධිපති ක්‍රමයට අප මුලින් විරුද්ධ වුව ද ඒ ක්‍රමයත් පාර්ලිමේන්තු මැතිවරණවල දී යොදාගත් අනුපාත ක්‍රමයත් නොවන්නට ඊළම දී තරමක කාලයක් ගතවීමට ඉඩ තිබිණි. ඒ ක්‍රමය නොවන්නට ප්‍රභාකරන් පැරදවීම ද ඉතාමත් දුෂ්කර කාර්යයක් වීමට තිබිණි. ඉන් අදහස් කරන්නේ ප්‍රභාකරන් හා කොටි සංවිධානය පහසුවෙන් පරාජය කිරීමට හැකි වූ බව නො වේ. කොටි සංවිධානය පැරදවීමේ දී සරත් ෆොන්සේකා මහතා ප්‍රධාන රණවිරුවන් විසින් කරන ලද කැපකිරීම් මොහොතකටවත් අමතක නොකළ යුතු ය.

එහෙත් මෙහෙයුම්වලට අවශ්‍ය ව තිබූ දේශපාලන නායකත්වය නිසි අයුරින් ලබාදීමට මහින්ද රාජපක්ෂ මහතාට විධායක ජනාධිපති ක්‍රමය බෙහෙවින් උපකාරී විය. වඩා වැදගත් වූයේ දේශපාලන නායකත්වය බව අමුතුවෙන් කිවයුතු නො වේ. අප ඒ දිනවල දේශපාලන නායකත්වය අවශ්‍ය බව කියන විට හමුදා මෙහයුම් හා දේශපාලනය මිශ්‍ර කරන්නේ යැයි අපට අවඥා සහගත ව කතාකළ අය අද මහා උජාරුවෙන් මහින්ද රාජපක්ෂ මහතා විසින් දෙන ලද දේශපාලන නායකත්වය ගැන කතාකිරීම ගැන අපට සැකයක් ඇතිවෙයි.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකිරීම යන්න එදා මෙන් අද ආකර්ෂණීය සටන්පාඨයක් නොවන්නේ ඉහත සඳහන් කරුණු හේතුවෙනි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම යන්න එ ජා ප හා ජ වි පෙ එකතුකිරීමට වුවත් අද ප්‍රමාණවත් නො වේ. ඒ බව ඒ පක්ෂ දෙකේ නායකයන්ට මේ වන විට අවබෝධ වී ඇතැයි සිතමි. වෙනත් කිසිම පොදු ප්‍රතිපත්තියක් සොයාගැනීමට නොහැකි වීම නිසා ඔවුන් ඒ සටන්පාඨයට ඇදී ගිය ද අද එයට රටේ එතරම් ඉල්ලුමක් නැත.

© Prof. Nalin De Silva

එ ජා පක්‍ෂය ප්‍රමුඛ ප්‍රභාකරන්ගේ මස්සිනාලාගේ සංධානය හා ජ වි පෙ අතර අද ඇති එකම පොදු බව මහින්ද රාජපක්‍ෂ මහතා ජනාධිපතිවරණයෙන් පැරදවීමට ඇති අවශ්‍යතාව පමණ ය. එහෙත් ඔවුන්ගේ අවාසනාවකට ඔවුන්ට එය මැතිවරණ ප්‍රකාශයට ඇතුළත් කළ නො හැකි ය. එමෙන් ම ඔවුන්ට ඒ සඳහා සුදුසු අපේක්‍ෂකයකු ද නැත. එබැවින් ඔවුහු ඊනියා පොදු අපේක්‍ෂකයකු ජයග්‍රහණය කරවා ඔහු ලවා ජනාධිපති ක්‍රමය අහෝසි කරවීමේ බලාපොරොත්තුවන් කටයුතු කරති. එහෙත් මේ කටයුත්ත ඔවුන් සිතන තරම් පහසු වූවක් නො වේ.

පළමුවෙන් ම ඔවුන්ගේ මූලික අවශ්‍යතාව වසංකිරීමට ඇති නොහැකියාව වෙයි. අවුරුදු තිහකට වැඩි කාලයක් මෙරට ක්‍රියාත්මක වී ඇති විධායක ජනාධිපති ක්‍රමයට දේශපාලන පක්‍ෂ විරුද්ධ වන්නේ ඔවුන් විපක්‍ෂයේ සිටින විට පමණක් බව මෙරට වැඩිහිටි ඡන්දදායකයෝ දනිති. තරුණ ඡන්දදායකයෝ විධායක ජනාධිපති ක්‍රමය හැරෙන්නට වෙනත් ක්‍රමයක් නො දනිති. විශේෂයෙන් ම විධායක ජනාධිපති ධුරය උපයෝගී කරගෙන දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසුව පැවැත්වෙන ප්‍රථම ජනාධිපතිවණයේ දී විධායක ජනාධිපතිධුරය අහෝසි කළ යුතු බවට කෙරෙන යෝජනාව බොල් සටන් පාඨයක් බවට පත්වෙයි. විපක්‍ෂය අවංක නම් කළ යුත්තේ මහින්ද රාජපක්‍ෂ මහතා පරාජය කිරීමට ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටීම ය.

කෙසේ වුවත් විපක්‍ෂයේ නොහැකියාව හේතුවෙන් අසීරු තත්වයකට පත්ව ඇත්තේ හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතා ය. අද ඒ මහතා අල්ලපු අත්තත් පයගහපු අත්තත් නැති තත්වයකට පත් වී ඇත. ආණ්ඩුව හා ඒ මහතා අතර යම් විරසකයක් ඇති වූ බව පැහැදිලි ය. එයට හේතුව අපි නො දනිමු. ඒ සමහර විට දේශීය විදේශීය වැරදි වාර්තා හෝ ඒ මහතාගේ චරිත ස්වභාවය හෝ වෙනත් කරුණක් නිසා වූවක් විය හැකි ය. ඒ කුමක් වුවත් විපක්‍ෂ දේශපාලන පක්‍ෂ ඒ විරසකය දඩමීමා කරගෙන ඒ මහතා බළල් අතක් ලෙස යොදාගැනීමට උත්සාහ කළහ.

එහෙත් ඒ මහතා එසේ බළල් අතක් ලෙස යොදාගත හැකි පුද්ගලයෙක් නො වේ. ඒ මහතාගේ ඉල්ලා අස්වීමේ ලිපිය හා ඇමුණුම පැහැදිලිව ම එජාප සන්ධානයේ හා ජවිපෙ නායකයන්ගේ මැදිහත්වීමෙන් හා එකඟත්වයෙන් ලියැවුණු එකක් බව පැහැදිලි ය. ඉල්ලා අස්වීම භාර දී පැය තුනක් ගතවීමට පෙර ලිපිය ජවිපෙ වෙබ් අඩවියේ පළ වී ඇත. එහෙත් සරත් ෆොන්සේකා මහතා භාර දී ඇත්තේ එසේ එකඟ වූ ලිපිය නො වේ. ඒ මහතා ඊනියා අවතැන්වූවන්ගේ ප්‍රශ්නය ඇතුළු කරුණු කිහිපයක් පිළිබඳ ව තම පෞද්ගලික ස්ථාවරයට ගැලපෙන පරිදි ලිපිය වෙනස් කර ඇත.

සරත් ෆොන්සේකා මහතා ඉදිරිපත් කෙරුණ ද ඔහුට ජයගැනීමට කිසිම ඉඩක් නැත. එහෙත් යම් අයුරකින් ඔහු ජයග්‍රහණය කළහොත් විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවට ඇති සහතිකය කුමක් ද? සරත් ෆොන්සේකා මහතා තම ජයග්‍රහණය රනිල් වික්‍රමසිංහ මහතාට පූජාකර නොයන බව අන් කිසිවකුටත් වඩා හොඳින් වික්‍රමසිංහ මහතා දනියි. දැන් රනිල් වික්‍රමසිංහ සරත් ෆොන්සේකා මහතාට කොන්දේසි ඉදිරිපත් කරන්නේ කුමක් අරමුණු කරගෙන දැයි පැහැදිලි විය යුතු ය. කී වතාවක් පරාජය වුව ද එජාප ප්‍රමුඛ ප්‍රභාකරන්ගේ මස්සිනාලාගේ සංධානයෙන් රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත්කිරීමට(වීමට) ඇති සම්භාවිතාව අධික ය.

එවිට සරත් ෆොන්සේකා මහතාට ඉතිරිවන්නේ ජ වි පෙ පමණ ය. බලය ලබාගැනීම සඳහා හැකිනම් හමුදාව යොදාගැනීමේ සිට විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට බලාපොරොත්තුවන ජවිපෙට සරත් ෆොන්සේකා මහතා පාවිච්චි කිරීම එතරම් ප්‍රශ්නයක් නො වේ. එහෙත් එවැනි ක්‍රියාමාර්ගයකින් ජ වි පෙ ඉලක්කවලට යෑමට නො හැකි ය. සරත් ෆොන්සේකා මහතා ජ වි පෙ මගින් ජනාධිපතිවරණයට ඉදිරිපත් කෙරුණහොත් ඉන් ඒ මහතාට සිදුවන්නේ විශාල අවැඩකි. ජනාධිපතිවරණයේ දී සරත් ෆොන්සේකා මහතා දේශප්‍රේමී බවින් දේශද්‍රෝහී තත්වයකට පත්කිරීමට ආණ්ඩුව ක්‍රියා කරනු ඇත. දැනටමත් ඒ පිළිබඳ ඉඟි පහළ කෙරී ඇත. ජවිපෙ සැබවින් ම සරත් ෆොන්සේකා මහතාට ගරු කරන්නේ නම් ඔවුන් කළ යුතුව ඇත්තේ ඒ මහතා ජනාධිපතිවරණයට ඉදිරිපත් නො කිරීම ය. අනෙක් අතට සරත් ෆොන්සේකා මහතා කළ යුත්තේ මේ අවස්ථාවාදී දේශපාලන පක්‍ෂවල උගුල්වලට හසු නොවී තම ගෞරවය රැකගෙන දේශපාලන ලෝකයෙන් සමුගැනීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva